# 10

# ඉස්ලාමීය සිද්ධස්ථාන

لاَ تُشَدُّ الرِّحَالُ إِلاَّ إِلَى ثَلاَثَةِ مَسَاجِدَ: مَسْجِدِيْ هَذا ، وَالْمَسْجِدُ الْحَرَام ، وَالْمَسْجِدُ الأَقْصَى

**"ශුද්ධ වූ වන්දනා යාමට හැක්කේ, ශුද්ධ වූ ස්ථාන තුනකට පමණකි. මාගේ මෙම මස්ජිදය, මස්ජිදුල් හරාම් හා මස්ජිදුල් අක්සා." (බුහාරි)**

ඉස්ලාම් දහම තුළ මස්ජිදය ශුද්ධ වූ ස්ථානයක් ලෙස සැලකේ. එහි වැදගත්කම පිළිබඳ අල් කුර්ආනයේ හා හදීස්වල ස්ථාන රැසක ම පවසා ඇත. මෙම ශුද්ධ වූ ස්ථාන අතරින් වඩාත් උසස් කොට සැලකෙන පරිශුද්ධ වූ ස්ථාන 3ක් ලෙස කඃබතුල්ලාහ්, මස්ජිදුල් අක්සා, මස්ජිදුන් නබවි හැඳින්විය හැක. මෙම උතුම් ස්ථාන තුනෙහි ම ශුද්ධ වූ විශේෂත්වය පිළිබඳ අල් කුර්ආනය හා සුන්නා වර්ණනාත්මක ව පවසා ඇත. මෙම ශුද්ධ වූ ස්ථාන තුන ම මුස්ලිම් සමාජයේ ජීවනාලිය මෙන් එකට බැඳී පවතී. එම නිසා ඒවායේ වැදගත්කම ද ඒවා කෙරෙහි අප සතු වගකීම් ද දැන ක්‍රියා කිරීම ආගමික යුතුකමකි.

මෙම ශුද්ධ වූ ස්ථාන තුන ම කීර්තිමත් ඓතිහාසික විශේෂත්වයක් දරණ අතර සමාජය තුළ ඒවායෙහි බලපෑම් විවිධාකාර ය. ඒවායෙහි ආධ්‍යාත්මික වටිනාකම් පිළිබඳ නබිතුමා මෙසේ පැවසූහ. "මස්ජිදුල් හරමයේ ඉටු කරනු ලබන සලාතයක් සලාත් ලක්ෂයක් ඉටු කළා හා සමාන වේ. මගේ මෙම පල්ලියේ ඉටු කරනු ලබන සලාතයක් සලාත් දාහක් ඉටු කළාට සමාන වේ. මස්ජිදුල් අක්සාහි ඉටු කරනු ලබන සලාතයක් සලාත් පන්සීයයක් ඉටු කළා හා සමාන වේ." (බුහාරි)

එලෙස ම, වන්දනා කළ හැකි සිද්ධස්ථාන වශයෙන් මෙම ස්ථාන තුන පමණක් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා සඳහන් කර ඇති බැවින් අනෙකුත් මස්ජිද්වලට වඩා මේවාට ප්‍රමුඛස්ථානයක් හිමි වීමට හේතු වී ඇත.

"වන්දනාමාන කළ හැක්කේ සිද්ධස්ථාන තුනකට පමණි. මගේ මෙම පල්ලිය, මස්ජිදුල් හරාම්, මස්ජිදුල් අක්සා" (බුහාරී)


මෙම සිද්ධස්ථාන තුනෙහි ම විශේෂත්වය හා වැදගත්කම වෙන් වෙන් වශයෙන් සළකා බලමු.

## 1. කඃබතුල්ලාහ්

කඃබතුල්ලාහ් ඉස්ලාමය තුළ ප්‍රථමස්ථානය හිමි කරගත් දේවස්ථානය වේ. ලොවෙහි ප්‍රථමයෙන් ම ඉදි කරන ලද දේවස්ථානය ද මෙය වේ. "(මෙලොවෙහි දෙවියන් නැමදීමට) මිනිසුන් උදෙසා සකස් කරන ලද දේවස්ථාන අතරින් ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නේ නියත වශයෙන් ම බක්කාවෙහි (මක්කාවෙහි) පිහිටි මෙම දේවස්ථානය වේ. එය ඉතා ම භාග්‍ය ගෙන දෙන්නකි; ලෝක වැසියන්ට යහමග පෙන්වන ස්ථානයකි. (3ඃ ආල ඉම්රාන් 96)

"කඃබාව ප්‍රථමයෙන් ම ආදම් අලෛහිස්සලාම් තුමා ඉදි කළේ ය." යන්න ඉතිහාසය පවසයි. ඊට පෙර මලක්වරුන් ඉදි කළා යැයි පොදු විශ්වාසයක් ද පවතී. නූහ් අලෛහිස්සලාම් තුමාගේ කාලයේ දී ඇති වූ ගංවතුරින් පුපුරා ගොස් පසු ව එම ස්ථානය වැලි ගොඩක් සේ තිබුණි. අල්ලාහ්ගේ අණ පරිදි ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා බිරිඳ වූ හාජරා තුමිය හා පුත් ඉස්මාඊල් පලස්තීනයේ සිට කැඳවා ගෙන ගොස් තනි ව අතහැර දමා නැවත හැරී ගියේ මෙම ස්ථානයේ දී ය. භාග්‍ය ලත් මෙම පවුලේ පරිත්‍යාගශීලිත්වය උදෙසා අල්ලාහ් එම ස්ථානයේ zසම් zසම් නම් නොහිඳෙන උල්පතක් දායාද කළේ ය. එම උල්පත හේතුවෙන් ජනතාව එම ස්ථානයේ පදිංචි වී ජීවත් වීමට පෙළඹුණි.

ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාණෝ සිව් වතාවක් මක්කාවට ගොස් ඇත්තාහ. සිව්වන වතාවේ පැමිණි විට පියා හා පුතා එක් ව කඃබාව ඊට අදාළ ස්ථානයේ නැවත ගොඩනැගූ බව සඳහන් වෙයි.



තව ද ඉබ්රාහීම් "(මාගේ) රබ්, (මක්කාහ්ව වන) මෙම (ස්ථානය) අභයදයි නගරයක් (බවට පත්) කරන්න. තව ද එහි වැසියන්ගෙන් අල්ලාහ් ගැන ද අවසාන දිනය ගැන ද, විශ්වාස කරන්නවුනට අනුභව කිරීම සඳහා (සෑම වර්ගයක ම) පලතුරු සපයන්නන් ද ලබා දෙනු මැන." ඉබ්රාහීම් කී අවස්ථාව සිහියට නගනු. (2 :126)

ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාණන් එක් කොටයක් මතට නැග, සිටගෙන කෑබාවේ බිත්ති ගොඩනැගුවේ ය. එම කොටය මත වර්තමානය දක්වා ද ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ පා සළකුණ දක්නට ලැබේ. එම ස්ථානය සලාත් කරන ස්ථානය බවට පත් කර ගන්නා ලෙස අල්ලාහ් (2 අල් බකරා :125) වන වැකියෙන් පවසයි.

ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ කාලයේ සිට ඒකදේව වාදයේ සංකේතය ලෙස දිස් වූ කෑබාව, ආසන්න වශයෙන් වසර දෙදාහකට පසු කුලාආ ගෝත්‍රික අම්ර් ඉබ්නු ලුහයි නැමැත්තා "හූබල්" නම් ප්‍රතිමාව කෑබාව මැද සිටුවීමත් සමග කෑබාව ප්‍රතිමා නමස්කාර කරන ස්ථානයක් බවට පත් විය.

ක්‍රි. ව. 440 දී ඉස්මාඊල් අලෛහිස්සලාම් තුමාගෙන් පැවත ආ අද්නාස් නැමැත්තාගේ පරම්පරාවෙන් පැමිණි කුසෙයි නැමැත්තා මක්කාව අතපත් කර ගැනීමෙන් පසු මක්කාවේ නායකත්වය කුරෛෂිවරුන්ට ලැබුණි. පසුව හාෂිම් පරම්පරාවෙන් පැමිණි අබ්දුල් මුත්තලිෆ් ඉතා බලවත් කෙනකු වූ බැවින් කෑබාවේ පාලනය ඔහුට හිමි විය. සියවස් ගණනාවකට පෙර ජුර්හූම් ගෝත්‍රිකයන් විසින් සම්පූර්ණයෙන් ම වසා දමනු ලැබූ **z**සම් **z**සම් ළිඳ ඔහු විසින් නැවත සොයා ගන්නා ලදි. මොහුගේ කාලයේ දී අබ්රහාගේ ඇත්සේනා සිදුවීම සිදු විය.

ඇත් සේනා සිදුවීම සිදු වී වසර 30කට පසු මක්කාවේ නැවත කෑබාවේ ප්‍රතිසංස්කරණ සේවාව ආරම්භ කරන ලදි. අවසානයේ දී හජරුල් අස්වද් ගල නියමිත ස්ථානයෙහි තැන්පත් කරන්නා කවරකු ද යන කරුණෙහි දී කුරෛෂිවරුන් අතර ඇති වූ මතභේද හමුවේ විනිසුරු ලෙස නියම කරන ලද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දෑතින් එය තැන්පත් කරනු ලැබීම විශේෂ සිදුවීමකි.

හිජ්රතයට පසු නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා හා සහාබාවරු තම සලාත්වල දී පලස්තීනයේ පිහිටි මස්ජිදුල් අක්සාව පෙරටු කර ගෙන ම සලාත් ඉටු කළහ. නමුදු "මක්කා පිහිටි කෑබාව පෙරටු කර සලාතය ඉටු කළ යුතු ය" යන දැඩි ආශාව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් තුළ තිබුණි. එහෙයින් අල්ලාහ් කෑබාව පෙරටු කර සලාතය ඉටු කරන ලෙස අණ කළේ ය. මේ පිළිබඳ අල් කුර්ආනය මෙසේ පවසයි.

"(නබි මුහම්මද්) ඇත්තෙන් ම නුඹ අහස දෙසට නිතර නුඹගේ මුහුණ යොමු කරනු අපි දකින්නෙමු. නුඹගේ සිත සතුටු කරවන කිබ්ලාවට (දෙස) අපි නුඹ යොමු කරවන්නෙමු. එබැවින් නුඹගේ මුහුණ (මක්කාහ්වේ) මස්ජිදුල් හරම් දෙසට යොමු කරනු. (මින් මතු මුස්ලිම්වරුනි) නුඹලා කොතැනක සිටියත් (සලාතයේ දී) නුඹලාගේ මුහුණු එදෙසට යොමු කරනු. (2 අල් බකරා :144)

හිජ්රි 8 දී මක්කාව ජය ගත් නබිතුමා කෑබාවෙහි රඳවා තිබූ සියලු ම ප්‍රතිමා ඉවත් කර නැවත ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ ධර්මය වන ඒකදේවවාදය එහි ස්ථාපිත කළහ. එදා සිට අද දක්වා කෑබතුල්ලාහ්ව උතුම් වූ හජ් වගකීමට අයත් ස්ථානය ලෙස ද මුස්ලිම් සමාජයේ හදවත ලෙස ද පවති.

## 2. මස්ජිදුල් අක්සා

පලස්තීනයේ පිහිටි මස්ජිදුල් අක්සාව ද මුස්ලිම්වරුන්ගේ සිද්ධස්ථානයකි. මෙහි ඉතිහාසය ද කෑබාව සේ ම ඉපැරණි ය. ප්‍රථමයෙන් ආදම් අලෛහිස්සලාම් තුමා ගොඩ නඟන ලද මෙම මස්ජිදය කැඩී බිඳී ගොස් තිබුණි. ඉන් පසු ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා එය ප්‍රතිසංස්කරණය කළේ ය, යන්න බොහෝ දෙනකුගේ අදහස වේ. පහත දැක්වෙන හදීසය ද එය ස්ථිර කරයි.

මස්ජිදුල් අක්සාව පිළිබඳ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගෙන් විමසූ විට එතුමාණෝ පහත සඳහන් පිළිතුර පැවසූහ. අබූදර් අල් කිෆාරි රළියල්ලාහු අන්හු තුමා ප්‍රකාශ කළේ ය. "මම අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් "අල්ලාහ්ගේ දූතයාණෙනි! මහපොළොවේ ප්‍රථමයෙන් ම ගොඩ නඟන ලද දේවස්ථානය කුමක් ද ?" යැයි විමසුවෙමි. එයට නබිතුමා "මස්ජිදුල් හරාම්" යැයි පිළිතුරු දුන්හ. "පසුව කුමක් ද?" යැයි විමසුවෙමි. එයට "මස්ජිදුල් අක්සා" යැයි පිළිතුරු දුන්හ. "ඒ දෙක අතර ඇති කාල පරතරය කොපමණ ද" යැයි විමසුවෙමි. එයට "වසර 40කි" යැයි පිළිතුරු දුන්හ. (බුහාරි)

අල්ලාහ් මස්ජිදුල් අක්සාව කේන්ද්‍ර කර ගත් ඒ අවට වන ප්‍රදේශ ද ශුද්ධ භූමියක් බවට පත් කළේ ය. ඉතිහාසයේ මෙම ප්‍රදේශය ෂාම් යන දේශය තුළ ඇති කරන ලදි.



මස්ජිදුල් අක්සාව හා ෂාම් දේශය වැදගත් වීමට හේතු වූයේ එය නබිවරුන් බොහෝ දෙනකු ජීවත් ව මියගිය ස්ථානයක් වන නිසාවෙනි. ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා මස්ජිදුල් අක්සාව ඉදි කළ පසු ඉස්හාක් අලෛහිස්සලාම්, යාකූබ් අලෛහිස්සලාම් සහ දාවූද් අලෛහිස්සලාම් යන නබිවරු පාලනය කළහ. යූසුෆ් අලෛහිස්සලාම් තුමා හට එතුමාගේ සහෝදරවරුන් ද්‍රෝහි වීමේ ප්‍රතිඵලයක් ලෙස යඃකූබ් අලෛහිස්සලාම් තුමා හට හා එතුමාගේ පවුලේ උදවියට ඊජිප්තුවේ පදිංචි වී ජීවත් වීමට සිදු විය. එහෙයින් මස්ජිදුල් අක්සාව හා ශුද්ධ භූමිය ඔවුන්ට අහිමි විය. මූසා අලෛහිස්සලාම් තුමා ප්‍රමුඛ බොහෝ නබිවරුන් එය නැවත ලබා ගැනීමට උත්සාහ කළ ද එය සාර්ථක නොවී ය. පසුව දාවූද් අලෛහිස්සලාම්තුමා මස්ජිදුල් අක්සාව විශේෂිත වූ ආකාරයකට නැවත ඉදි කර පුළුල් කළේ ය. එතුමාට පසු ඊසා අලෛහිස්සලාම්තුමා පැමිණෙන තුරු බොහෝ නබිවරු මස්ජිදුල් අක්සාවෙහි සලාතය ඉටු කර ජනතාවට දේශනා කරමින් සිටියහ.

ක්‍රි. ව. 620 දී මුහම්මද් සල්ලල්ලාහු අලෛහිස්සලාම්තුමාගේ මිහ්රාජ් ගමන සිදු විය. අල්ලාහ් බැහැදැකීම උදෙසා සිදු වූ මෙම ගමනෙහි පළමු කොටස වූයේ මක්කාවේ සිට මස්ජිදුල් අක්සාවට යෑම වේ. එහි දී පෙර නබිවරුන්ට නායකත්වය දරමින් සලාතය මෙහෙයවීමේ දුර්ලභ අවස්ථාවක් අල්ලාහ් නබි සල්ලල්ලාහු අලෛහිස්සලාම්තුමාට උදා කර දුන්නේ ය. ඉන්පසු සිද්රතුල් මුන්තහාවේ දී අල්ලාහ් සමග දර්ශනය සිදු විය. එවිට සලාතය ත්‍යාගයක් ලෙස ලබා දී නබිතුමාට මස්ජිදුල් අක්සාව කිබ්ලාව වශයෙන් නියම කරන ලදි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මස්ජිදුල් හරාම් සිට මස්ජිදුල් අක්සාවට ගිය ගමන ඉස්රා ලෙස හඳුන්වනු ලබයි. මේ පිළිබඳ ඉස්රා නැතහොත් බනු ඉස්රායීල් යන පරිච්ඡේදයේ ප්‍රථම වැකිය පැහැදිලි ව සඳහන් කරයි. සමහර විද්වතුන් මෙම වැකිය විවරණය කරන විට, "නබිවරුන්ගේ භූමිය වන පලස්තීනය මින්මත්තට මුහම්මද් සල්ලල්ලාහු අලෛහිස්සලම්තුමාට ම හිමි වේ." යන්න තහවුරු කිරීම පිණිස ඉස්රා ගමන සිදු විය යැයි පැවසූහ.

ක්‍රි. ව. 633 දී නබිතුමාගේ වෆාතයත් සමඟ මදීනාව අගනුවර කොට ගෙන ගොඩ නැගුණු ඉස්ලාමීය අධිරාජ්‍යයට රෝමවරුන් හා පර්සියානුවරුන් තර්ජනයක් විය. එමනිසා මොවුන්ට විරුද්ධ ව පළමු කාලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හුතුමා සූදානම් කර යවන ලද සේනාව දෙවන කලීෆා උමර් රළියල්ලාහු අන්හුතුමාගේ කාලයේ දී ජයග්‍රහණ රැසක් අත් කර ගත්හ. පලස්තීනය ජය ගැනීම ද ඉන් එකකි. මෙය ක්‍රි. ව. 636 දී (හි.15) සිදු විය.

ජයග්‍රහණයෙන් පසු කුද්ස් නගරයේ පාලනය භාර ගැනීමට උමර් රළියල්ලාහු අන්හු තුමා කැඳවනු ලැබී ය. එතුමාට එහි උරුමය භාර දෙනු ලැබුණි. එවිට ක්‍රිස්තියානුවරුන් සහ උමර් රළියල්ලාහු අන්හුතුමා තමන් අතර ගිවිසුමක් ඇති කර ගත්තෝ ය. අදටත් එය උමර් (ගිවිසුම) යන නමින් ආරක්ෂා කරමින් පැමිණෙති.

මස්ජිදුල් අක්සාවට අයත් ප්‍රදේශය අපිරිසිදු ව තිබුණු බව දැනගත් උමර් රළියල්ලාහු අන්හු තුමා එම ප්‍රදේශයට ගොස් ප්‍රථමයෙන් ම තම දෑතින් ම එම ප්‍රදේශය පිරිසිදු කිරීම ආරම්භ කළේ ය. පසු ව එහි රකාඅත් දෙකක සලාතයක් ඉටු කළේ ය. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට පසු එහි සලාතය ඉටු කළ ප්‍රථම මිනිසා උමර් රළියල්ලාහු අන්හු

තුමා වේ. එහි අzසාන් පැවසූ ප්‍රථම මිනිසා බිලාල් රළියල්ලාහු අන්හු තුමා වේ. ඉන්පසු උමර් රළියල්ලාහු අන්හුතුමාගේ සේවාවේ නාමයෙන් පුද්ගලයන් තුන්දහසක ප්‍රමාණයක් සලාත් කළ හැකි පරිදි පුළුල් කර මස්ජිදුල් අක්සාව ප්‍රතිසංස්කරණය කරන ලදි.

ක්‍රි. ව. 1088 සිට ක්‍රි. ව. 1290 දක්වා මුස්ලිම්වරුන් හා යුරෝපීය ක්‍රිස්තියානුවරුන් අතර ශුද්ධ භූමි හේතු කොටගෙන කුරුස යුද්ධය සිදු විය. කුරුස යුද්ධයේ සේනාවෙන් මස්ජිදුල් අක්සාව හා පලස්තීනය නැවත නිදහස් කර ගත් නායකයින් ලෙස සලාහුද්දීන් අයියූබි, මහ්මූද් අල්කුදුස් යන අයට ගෞරවය හිමි වේ. මේ දෙදෙනා ම ඊජිප්තුව පාලනය කළ රාජ්‍ය පාලකයන් වේ.

1924 දී ඉස්ලාමීය කිලාෆතය බිඳ වැටීමත් සමඟ අරාබි රාජ්‍යයන් කැඩී බිඳ යන ලදි. 1948 දී පලස්තීනය තුළ ඊශ්‍රායලය නමින් රටක් ගොඩ නගන ලදි. එදින සිට අද දක්වා මස්ජිදුල් අක්සාවට යෑමේ දී මුස්ලිම්වරු විවිධ හිරිහැර අත්විඳිමින් පසුවෙති. පලස්තීන් වැසියන් තම රට ද මස්ජිදුල් අක්සාව ද නැවත ලබා ගැනීම වෙනුවෙන් සටන් වදිති. 1967 දී ඊශ්‍රායල වැසියන් මස්ජිදුල් අක්සාවට ගිනි තැබූහ. එවිට සුල්තාන් නූරුද්දීන් ජන්ගී යන රජුගේ ඓතිහාසික වටිනාකමින් යුත් මිම්බර් වේදිකාව ද ගිනි ගන්නා ලදි.

පරමාන්ත දිනයේ ඉතා වැදගත් පෙරනිමිති අතරින් මුස්ලිම්වරු දජ්ජාල් සමඟ යුධ වැදීම ද එකකි. එවිට ඊසා අලෛහිස්සලාම් තුමාණෝ අහසේ සිට පහළ වී මුස්ලිම්වරුන් සමඟ එක් ව සටන් කර දජ්ජාල් ඝාතනය කර දමති. හදීස් මූලාශ්‍රයට අනුව මෙම සිදුවීම මස්ජිදුල් අක්සාව පිහිටි ශුද්ධ භූමිය තුළ සිදු වේ, යන්න අවධානය යොමු කළ යුතු කරුණකි.

## 3. මස්ජිදුන් නබවි

ඉස්ලාමීය දෙවන ආධ්‍යාත්මික තරාතිරම හිමි මස්ජිදුන් නබවියේ ඉතිහාසය මුහම්මද් සල්ලල්ලාහු අලෛහිස්සලාම්තුමාගේ හිජ්රත් ගමනින් ඇරඹේ. ක්‍රි. ව. 622 සැප්තැම්බර් 27 දී මදීනාවට පැමිණි නබිතුමා අබූ අයියුබ් රළියල්ලාහු අන්හු තුමාගේ නිවසේ සිටිමින් මස්ජිදුන් නබවියේ ඉදිකිරීමේ වැඩ කටයුතු ආරම්භ කළහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්තුමා මදීනාවට ඇතුළු වූ විට එතුමාගේ ඔටුවා පළමු ව හිඳගත් ස්ථානය, දේවස්ථානයක් ඉදි කිරීම සඳහා තෝරා ගන්නා ලදි. එම ස්ථානය අනාථයන් දෙදෙනෙකුට අයිති ව තිබුණි. ඔවුන්ගෙන් එය මිල දී ගෙන ඉදිකිරීමේ වැඩකටයුතු ආරම්භ කළ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා ඉදි කිරීමේ කාර්යයෙහි මිතුරන් සමඟ තමන් ද එක් ව දැඩි සේ වෙහෙසුණාහ. දේවස්ථාන දොරටුවේ දෙකෙළවර ගලින් සාදන ලදි. එහි බිත්ති ගල් හා පස්වලින් සාදා රටඉඳි ගස් කඳන්වලින් කණු සවි කර එම රටඉඳි අතුවලින් වහලය ද නිර්මාණය කරන ලදි.

ආරම්භයේ දී මස්ජිදුන් නබවිය මීටර් 35ක දිගකින් හා මීටර් 30ක පළලින් ද දොරටු 3කින් ද සමන්විත විය. දේවස්ථානයත් සමග සම්බන්ධ කර එහි අයිනකට වන්නට නබිතුමාගේ බිරියන් වෙනුවෙන් ද කාමර කිහිපයක් සාදන ලදි. ඉදිකිරීමේ කටයුතු අවසාන වීමෙන් පසු නබිතුමා අබූ අයියූබ් රළියල්ලාහු අන්හුතුමාගේ නිවසින් පිට වී මෙම කාමරවල පදිංචි වූහ. ඉන්පසු නිවාස නොමැති දුගී මිතුරන් සඳහා ද එක් කොටසක් වෙන් කරන ලදි. මොවුන් අස්හාබුස් සුෆ්ෆා (ගෙපිළ මිතුරන්) ලෙස හඳුන්වන ලදි. මෙලෙස ඉතා ම සරල ආකාරයෙන් ආරම්භ කරන ලද මස්ජිදුන් නබවිය පිළිබඳ අල්ලාහ් පහත ආකාරයෙන් ප්‍රශංසා කළේ ය.



"(නබි මුහම්මද්) නුඹ කිසි විටෙක (සලාතය ඉටු කිරීමට) එහි නොසිටිය යුතු ය. මුල් දවස සිට ම තක්වා (බිය බැතිමත්බව) මත ගොඩ නගනු ලැබූ මස්ජිදය නුඹට (සලාත් සඳහා) එහි සිටීමට ඉතා සුදුසු තැන වේ. (ආත්ම) පාරිශුද්ධ ව සිටීමට කැමති ජනයාට අල්ලාහ් කැමති ය" (9 අත් තෞබා :108)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ කාලයේ දී මස්ජිදුන් නබවිය සලාතය සඳහා වන ස්ථානයක් ලෙස පමණක් නොතිබුණි. අධ්‍යාපනය ලබා දෙන පාසලක් ලෙස ද ජනතාවගේ ගැටලු විමසා තීන්දු ලබා දෙන උසාවියක් ලෙස ද රටේ ව්‍යවහාරික කටයුතු පිළිබඳ මන්ත්‍රීවරුන්ගේ අදහස් සාකච්ඡා කරන පාර්ලිමේන්තුවක් ලෙස ද Zසකාත් හා අනෙකුත් බදු රැස් කර බෙදා හරින භාණ්ඩාගාරයක් ලෙස ද, හමුදා කටයුතු සැලසුම් කර රණවිරුවන්ට පුහුණුව ලබා දෙන හමුදා කඳවුරක් ලෙස ද ආගන්තුකයන් හා

පණිවුඩකරුවන් පිළිගන්නා පිළිගැනීමේ මණ්ඩපයක් ලෙස ද එහි දායකත්වයේ ලැයිස්තුව දීර්ඝ වන්නේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කාලයේ දී කෛබර් සටනින් පසු ව මස්ජිදුන් නබවිය පුළුල් කිරීමේ අවශ්‍යතාව මතු විය. එවිට තවත් දිගින් මීටර් 15ක් ද පළලින් මීටර් 20ක් ද එක්වර වර්ගඵලය වර්ග මීටර 2500ක වන ලෙස විශාල කරන ලදි. පසුව උමර් රළියල්ලාහු අන්හු, උස්මාන් රළියල්ලාහු අන්හු යන අය ද උමෛයා, අබ්බාසියා, මම්ලුක් උස්මානීයා යන රාජ්‍ය පාලයකයන් ද අවසාන වරට සවුදි රජු ෆහද් බින් අබ්දුල් අZසීZස්තුමා ද අවශ්‍යතාවට අනුව එය පුළුල් කර අද ලොවේ අතිවිශාල ම දේවස්ථානයක් ලෙස මස්ජිදුන් නබවිය දිස් වේ.

ඉහත සාකච්ඡා කළ සිද්ධස්ථානවල සමාජීය දායකත්වය හා ඒවායෙහි ඓතිහාසික පසුබිම දෙස බලන විට මෙම සිද්ධස්ථාන 3 ම විවිධාකාර විශේෂ අංගවලින් යුක්ත බව දැක ගත හැකි ය.

### පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❖ القُضَاعَة ❖ المِعْرَاجُ ❖ سِدْرَةُ الْمُنْتَهَى ❖ الإِسْرَاءُ ❖ أَصْحَابُ الصُّفَّةِ ❖ كَعْبَةُ اللّٰهِ ❖
❖ المَسْجِدُ الأَقْصَى ❖ المَسْجِدُ النَّبَوِيّ ❖ الْهُبَلُ ❖ الجُرْهُمُ ❖ صَلاَحُ الدِّيْن
❖ مَحْمُودُ الْقُطْزِ ❖ نُورُ الدِّيْنِ الزَّنْكِي

### අභ්‍යාසය

1. පරිශුද්ධ වූ ස්ථාන තුනක් ගැන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කියමන සඳහන් කරන්න.
2. ශුද්ධ වූ කඃබාව ගැන අල් කුර්ආනය කුමක් සඳහන් කරයි ද ?
3. කඃබාවෙහි ඉතිහාසය කෙටියෙන් සඳහන් කරන්න.
4. මස්ජිදුන් නබවියෙහි වැදගත්කම කුමක් ද? එහි මුල් නිර්මාණය ගැන විස්තර කරන්න.
5. මස්ජිදුල් අක්සාව පිළිබඳ ඔබ දන්නා දේ කෙටියෙන් ලියන්න.